# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2418/17 - 2025 ජනවාරි මස 07 වැනි අඟහරුවාදා - 2025.01.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 300/14 හා 1984.06.08 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, 1984 අංක 122 හා 1984.05.28 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 300/14 හා 1984.06.08 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 1984 අංක 122 හා 1984.05.28 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

කේ.ඩී. ලාල්කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය : 4-3/9/2024/PC දඹුල්ල පූජා භූමි - අවසතු/ප්‍රත්‍යාදිෂ්ඨ
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය : 5/3/4/1/27/931-02
2024 දෙසැම්බර් මස 04 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල උප දිසාපති කොට්ඨාසයේ, දඹුල්ල නගර සීමාව තුළ සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංක 01 මිල්ලගහරුප්ප අංක 02 පාදෙණිය අංක



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04 හීන්මොරගොල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක 931 හා 1991.04.22 දිනැති පිඹුරෙහි පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම් :

**1. කැබලි අංක 02 - කෝන්ගහමුලයාය - ප්‍රමාණය: හෙක්: 0.0442**

උතුරට: කැබලි අංක 01 ;නැගෙනහිරට: තැම්මැන්නා ඇළ; දකුණට: කැබලි අංක 03; බටහිරට: මහා මාර්ගය.

EOG 01 - 0069

---

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වගන්තිය යටතේ නියමය

මගේ අංකය : 4-3/10/2013/UDA/639.

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : නුඑ/3/1/8/අත්පත්/160.

අංක 2395/27 හා 2024.07.31 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1 A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 අ (1) වගන්තිය යටතේ නියමයෙහි සඳහන් 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය ගැසට් කළ දිනය "2014 මැයි මස 05" යන්න වෙනුවට "2014 අගෝස්තු මස 25" යන්න ලෙසද, ගැසට් අංකය "1861/6" යන්න වෙනුවට "1877/9" යන්න ලෙසද, ආඥා අංකය "2014 අංක 94" යන්න වෙනුවට "2014 අංක 214" ලෙසද, නියමයේ පළමු උපලේඛනයේ "මු.පි.නු. 1840 හා 2021.09.06 දිනැති අනුරේඛනයේ " යන්න වෙනුවට "නු 1840 හා 2016.05.11 දිනැති පිඹුර සංශෝධනය කරමින් පිළියෙල කරන ලද 2016.11.02 දිනැති පිඹුරේ" ලෙසද නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

කේ.ඩී. ලාල්කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 04 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 - 0070

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.